එයා මාව විසිකරලා දැම්මා.

ආචාර්ය අජන්තා රණසිංහ



අජන්තා රණසිංහ

කුරුණෑගල තලම්මැහැර ගම්මානයේ පදිංචිව සිටි බටහිර වෛද්‍යවරයෙකු වූ කේ.බී. රණසිංහ සහ වාසනා රණසිංහ යුවලගේ දෙවැනි දරුවා ලෙස රණසිංහ ආරච්චිලාගේ අජන්තා සරත් කුමාර රණසිංහ මෙළොව එළිය දුටුවේ 1940 මැයි 30 දා ය. පන්නල රජයේ පාසලෙන් 'අ' යනු 'ආ' යනු කියැවූ සරත් කුමාර දරුවා දෙමාපියන් විසින් පසුව නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයට ඇතුළත් කරවූයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදීම සඳහාය. එම විද්‍යාලයෙන් සාමාන්‍ය පෙළ විභාගය සමත් වූ හෙතෙම පසුව පාසල් අධ්‍යාපනයට සමුදී නැවත ගමට ගියේය. අනතුරුව ගමේ පිරිවෙනට ඇතුළුවී කලා අංශයෙන් උසස් පෙළ විභාගයට පෙනී සිටියද සරසවි ප්‍රවේශය අහිමිවීමෙන් පසු රැකියාවක් වශයෙන් ඔහු තෝරාගත්තේ මාධ්‍යවේදයයි. 1966 වසරේ ලේක්හවුස් ආයතනයේ මාධ්‍යවේදියෙකු ලෙස රැකියාවට බැඳුණු සරත් කුමාර රණසිංහ පසුව 'දිනමිණ' සහ 'සිළුමිණ' පුවත්පත්හි ද මාධ්‍යවේදියකු ලෙස සේවය කර අවසානයේ ලේක්හවුස් ආයතනයෙන් විශ්‍රාම ලබන්නේ නවයුගය පුවත්පතේ කර්තෘවරයා ලෙස සේවය කරමින් සිටියදීය. ඒ වන විට දෙදරු පියෙකු වූ හෙතෙම වර්ථමානයේ නුගේගොඩ බැද්දගානේ පිහිටි සිය නිවසේ ප්‍රිය බිරියද සමග ජීවිතයේ සැදෑ සමය ගෙවමින් සිටින්නේය.

අජන්තා රණසිංහ යන නම කියූ පමණින් අද ඔබත් මමත් හොඳින් හඳුනන ජනප්‍රිය ගීත රචකයා බිහිවන්නේ අපගේ කතා නායකයා තුළිනි. පාසල් සිසුවකුව සිටියදීම තමන් තුළ කවි ලිවීමට තිබූ සහජ දක්ෂතාවය අභ්‍යාස කරමින් සිටි රණසිංහ ආරච්චිලාගේ අජන්තා සරත් කුමාර රණසිංහ පාසල් ජීවිතයට සමුදෙන්නේ ගුවන් විදුලියේ ළමා වැඩසටහන්වලට සම්බන්ධව කටයුතු කරමින් සිටියදීය. නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයේ සිසුවකුව සිටියදී එවක ගුවන් විදුලියේ ජනප්‍රිය ළමා වැඩසටහනක් වූ කේ.ඒ.ඩබ්. පෙරේරාගේ රේඩියෝ සඟරාවට සහ 'සිළුමිණ' පත්‍රයේ කමලා ළමා සමාජය පිටුවට කවි ලියූ හෙතෙම හා හා පුරා කියා ගේය පද රචනයට අත තබන්නේ කරුණාරත්න අබේසේකරගේ ළමා මණ්ඩපය වැඩසටහන තුළිනි. එම වැඩසහනට ඇතුළත් ළමා ගී තුනෙන් දෙකක් රචනා කිරීම මුළින්ම ඔහුට පැවරෙන අතර එතිදී දැක්වූ කුසලතාවය පසුකාලෙක රටේ නාමධාරී ගායක ගායිකාවන් රැසකට ගීත ලිවීමේ අවස්ථාව ඔහුට උදාකර දුන්නේය. පසුව ප්‍රේමසිරි කේමදාස විසින් හෙතෙම චිත්‍රපටි ගීත ක්ෂේත්‍රයට හඳුන්වා දෙනු ලැබූ අතර වාසනා චිත්‍රපටයේ එන ලතා වල්පොල විසින් ගායනා කරනු ලබන 'පොකුරු පොකුරු මල් සැණකෙලි ඔමරි ලතාවයි' ඔහු මුළින්ම ලියූ චිත්‍රපටි ගීතයයි. එදා මෙදා තුර ඔහු විවිධ ගීත විශාල ප්‍රමාණයක් ලියා ඇති අතර අමරදේව ගයන 'සදකඩ පහනේ රසිරුර වරුණේ' 'වීකසිත පෙම් පොකුරු පියුම්' වික්ටර් රත්නායක ගයන 'සිරිමා බෝ මැඩ මුණිඳුන් වැඩහිඳ' දයාරත්න රණතුංග ගායනා කරන 'දුරස්වන්නට මේ ලෙසින්' ටී.එම්. ජයරත්න ගායනා කරන 'මේ අයුරින් අපි සංසාරේ' සනත් නන්දසිරි ගායනා කරන 'ජගදා වන්දිත මහා කාරුණික' ඒ අතරින් එදා මෙන්ම අදටත් එකසේ ජනප්‍රිය ගී කීපයකි. සිය ගී නිර්මාණ සංගාතිත කර පුස්තක තුනක් එළිදක්වා ඇති අජන්තා රණසිංහ හොඳම ගේය පද රචනය උදෙසා පිළෙන ජනාධිපති සම්මාන තුනක්, සරසවි සම්මාන හතරක් ඇතුළුව විවිධ සම්මාන විශාල සංඛ්‍යාවකින් සම්භාවනාවට පාත්‍රවී වූවෙකි. ගීත රචනයට අමතරව ඔහු ලියූ පද්‍ය, කෙටි කතා සහ නවකතා කීපයක්ද වේ. 'තිවංක රේඛා' (1964) පද්‍ය සංග්‍රහය, 'මට ළඳුණි වරම් නැත' (1975), 'වින්කල් බාස්' (1977), 'ක්‍රියතුනි කරුණා කළ මැනව' (1981), 'සිහින කුමරු සහ ඕ නොමෝ' යන නවකතා, 'වීකසිත පෙම්' (1978), 'පහන් දොරින්' (1984), 'උඩුවියනක් සේ හිරු රැස් දෝරක්'(1990), යන ගේය පද කෘති ඒ අතරින් කීපයකි.

ඔබේ ජීවිතයේ මුල්ම අවදියෙන් අපි කතාව පටන් ගමු. ඔබේ ගම සහ පවුලේ තොරතුරු ටිකක් විස්තර කළොත්...?

මගේ ගම කුරුණෑගල, පන්නල හන්දියේ ඉඳළා සැතැප්ම දෙකක් දුරින් තියන තලම්මැහැර කියන සුන්දර ගම්මානය. තාත්තා ඉංග්‍රීසි වෛද්‍යවරයෙක්. මම ඉපදුනේ කොළඹ ද සොයිසා කාන්තා රෝහලේ. ඒ කාලේ තාත්තා ඒකක වැඩකළා. මම රස්සාව කරන කොට තාත්තා මිය ගිහිල්ලා. තාත්ත අවුරුදු හැටෙන් මැරුණේ සෝමාවතී ගිහිල්ලා අපි එනකොට හාවි ඇවැක් හැදිලා තාත්තා මියගියේ. තාත්තා ගමේ හිටිය ඉතාම යහපත් පුද්ගලයෙක්. ගමේ අය කියන්නේ බුදුන් උපන් දවසේ උපන් මහත්තයා කියලා. තාත්තා විශ්‍රාම ගිහිල්ලත් ගමේ පොඩි ඩිස්පැන්සරියක් දාගෙන නොමිලේ ගමේ මිනිස්සුන්ට බෙහෙත් දුන්නා. පාර්ලිමේන්තුවට ඉල්ලුවනම් උඩින්ම දිනනවා. හැබැයි කවදාවත් ඉල්ලන්න ගියේ නෑ. ඒ වුණාට තාත්තා දැඩි යූ එන් පී කාරයා. අම්මා නුගේගොඩ. අපි උපදින්න කලින් අම්මා ආනන්ද සාශ්‍රාලයේ ගුරුවරියක් වෙලා ඉඳලා තියනවා. බැන්දට පස්සේ අම්මා ඒ රස්සාවෙන් අයින් වෙලා තාත්තගේ ගමට ගිහින් යක්විල උප තැපැල් කාර්යාලයේ ස්ථානාධිපතිනිය විදිහට රැකියාව කළා. පවුලේ වැඩිමලා අක්කා. මම දෙවැනියා. මල්ලි තුන්වෙනියා. ඊට පස්සේ නංගිලා දෙන්නයි. පොඩි කාලේ අපි ඔක්කොම ගමේ ජීවත් වුණේ. ඒ අය අතරින් අද ජීවත්වෙන්නේ මමයි එක නංගි කෙනෙකුයි විතරයි.

ඔබ ගමේ කෙනෙක් කියලා කිව්වට ජීවිතේ වැඩි කාලයක් ගෙවලා තියෙන්නේ කොළඹ නේද ?

අධ්‍යාපන කටයුතුයි රස්සාවයි නිසා වැඩි කාලයක් කොළඹ ගත කරන්න සිද්ධ වුණා. කොළඹ ගෙවල් දොරවල් හදාගන්න සිද්ධ වුණා. පන්නල රජයේ පාසලට තමයි මුලින්ම මම ගියේ. ඉන් පස්සේ අම්මගේ ගම නුගේගොඩ නිසා අපිව එහෙ ගෙනල්ලා බැස්සුවා ඉංග්‍රීසි පාසලට දාන්න. නුගේගොඩ ශාන්ත ජෝන්ස් බාලිකා විද්‍යාලයේ පළවෙනි පන්තියට තමයි මුලින්ම මාව ඇතුළත් කළේ. පන්නල පාසලේ හිටපු පන්තිය එතනදි ගනන් ගත්තේ නෑ. සෙන් ජෝන්ස් එකේ පහළ පළවෙනියෙන් මම ඩබල් ප්‍රමෝෂන් එකක් ගත්තා දෙවෙනි ශ්‍රේණියට. ඉහළ පළවෙනියට ගියේ නෑ. දෙවෙනි පන්තියෙන් පස්සේ ශාන්ත ජෝනස් බෝයිස්කූල් එකට ගත්තා. එතන ඉඳළ උසස් පෙළ වෙනකම් ඒ ස්කෝල් හිටියේ. අපි බුදිව ළමයි වුණාට සෙන් ජෝන්ස් එකේ අපිට හොඳට සැළකුවේ නෑ. දෙමළ කතෝලික ළමයින්ට තමයි සැළකුවේ. සිංහල බෞද්ධ ළමයින්ට සැළකුවේ නෑ. හරියට වෙනස්කම් කළා. අඩම්තේට්ටම් කළා. මට ඕ ලෙවල් පාස්වුණාට පස්සේ ඉස්කෝලෙ එපා වෙලා තිබුණේ. මම එහෙමම ගමට ගහින් මාසයක් හමාරක් නතරව ඉඳළා ළග පිරිවෙනකින් තමයි උසස් පෙළ කළේ.

ඔබ ප්‍රසිද්ධව සිටින්නේ ගීත රචකයෙක් විදිහට. ඒත් ඔබේ වෘත්තීය ජීවිතය වෙනත් එකක් නේද? හැට හයේ ලේක්හවුස් එකේ සරසවිය පත්තරේ මාධ්‍යවේදියෙක් විදිහට මම රස්සාවට බැඳුණා. ඉන්පස්සේ සිළුමිණ, ඊළඟට දිනමිණ, අන්තිමට නවයුගය පත්තරේ ප්‍රධාන කර්තෘ විදිහට විශ්‍රාම යනතෙක්ම වැඩකළා. ලේක්හවුස් කර්තෘ මණ්ඩලයේ මගේ සේවා කාලය අවුරුදු තිස් හතරයි.

ඔබට ආචාර්ය උපාධිය ලැබුණ පසුවීම මොකක්ද ?

සෙන් ජෝන්ස් එකෙන් අයින් වෙලා ගමට ගිහින් ගමේ පිරිවෙනකින් මම කලා අංශයෙන් උසස් පෙළ කළා. ඒත් විශ්ව විද්‍යාලේ යන්න ලැබුණේ නෑ. පස්සේ අවුරුද්දක් දෙකක් ඔහේ නිකං හිටියා. ඊට පස්සේ තමයි මම ලේක්හවුස් රස්සාවට යන්නේ. ලේක්හවුස් එකේ වැඩකරන අතරේ මම ඉන්දියාවේ 'ඉන්ටනෂනල් ඕපන් යුනිවර්සිටි බ්‍රාන්චි' එකට නිසිස් එකක් ලිව්වා. ඉන්දියානු සම්භාව්‍ය සංගීතය ලංකාවේ භක්ති ගීතවලට බලපෑ අන්දම. ඒකට මට එහෙන් ආචාර්ය උපාධිය දුන්නා.

ගීත රචනයට යොමුවෙන්නේ ?

ගීත ලියන්න කලින් මම කවි ලිව්වා. ඉස්කෝලේ යන කාලේ මම සම්බන්ධ වුණා කේ.ඒ.ඩබ්. පෙරේරා මහත්තයාගේ රේඩියෝ සඟරාව වැඩසටහනට. ඒක සතිපතා ගුවන් විදුලියෙන් විකාශනය කෙරුණ සඟරාමය වැඩසටහනක්. ඒකට මමත් එක්ක ගිය අනෙක් අය තමයි සුනන්ද මහේන්ද්‍ර, මියගිය බණ්ඩාර විජේතුංග. ඒ වැඩසටහනට මම කවි ලිව්වා. කුඩා කාලේ ඉඳළා මට කවි ලිව්වීමේ හැකියාවක් තිබුණා. ඒක කොහොම ඇතිවුණා එකක්ද කියලා කියන්න මම දන්නේ නෑ. අපේ අම්මගේ ලොකු මල්ලි අශෝක පීරිස් මාමා රාජ්‍ය සම්මානලාභී කෙටිකතා කරුවෙක්. එයා කවිත් ලියනවා. අපි නුගේගොඩ සියලා ගෙදර ඉන්න කාලේ එයත් එහෙ හිටියා. එයා බැඳලා නෑ. එයා ඇසුරු කරන්නේ උපනන්ද බටුගෙදර, කපිල සෙනෙවිරත්න, සාගර පළාන්සූරිය වගේ කොළඹ යුගයේ කවියෝ. මම හිතන්නේ ඒ ආභාෂයත් මට ලැබෙන්න ඇති. කොහොම නමුත් කවි ලියන්න පටන් ගත්ත කාලේ ඉඳළා මම කමලා ළමා සමාජයට කවි ලියනවා. සිළුමිණේ තිබුණ මේ කිව් පිටුව තමයි ඒ කාලේ ලංකාවේ පත්තරේක තිබුණ එකම කවි පිටුව. ඉතිං දහයක් දොළහක් යැව්වම එකක් පළවෙනවා. පස්සේ ලංකාදීප ආයතනය පටන් ගත්තට පස්සේ වනිතා විත්ති කියලා පත්තරයක් ගැනුවා. ඒක තමයි ලංකාවේ ප්‍රථම කාන්තා පත්තරය. ඒකේ ළපටි පෙළ කියලා කොටසක් තිබුණා. ඒකටත් මම ලිව්වා. බොහෝ විට ලියන ඒව පළවුණා. ඔහොම ඉන්න කාලේ හෙළ කලා කෙත කියලා අපේ සංගමයක් පිහිටුවා ගත්තා. ඒකේ හිටපු කථිය තමයි පියසිරි නාගහවත්ත කරුණාරත්න අමරසිංහ ප්‍රේමතිලක මාපිටිගම හිමල් සරත්චන්ද්‍ර සුනන්ද මහේන්ද්‍ර. ඒකේ කවි පිටුවක් තිබුණා. ඒක සකස් කරන හිමල් සරත්චනඳු මාසයකට සැරයක් විතර අපිට අවස්ථාවක් දෙනවා ඒකට කවි පන්තියක් ලියන්න. අනුස්මරණ දිනවලට පත්තරවලට ලිපි ලියනවා. ඉරිදා ලංකාදීප පත්තරේට ඒවගේ ඒවා යැව්වට බොහොම කලාතුරකින් තමයි පළවෙන්නේ. කවි පන්ති සීයක් විතර යැව්වාම එකක් පළවෙනවා.

මම ලේක්හවුස් යන්න ඉස්සර කොහොම හරි කරුණාරත්න අබේසේකර මහත්තයාගේ ළමා මණ්ඩපයට සම්බන්ධ වුණා. මට මතක නෑ ඒක කොහොමද වුණේ කියලා. හමුත් ඒක ලොකු අවස්ථාවක් වුණා මගේ හැකියාවන් වර්ධනය කරගන්න. මේකෙ සින්දු තුනක් තියනවා. ඒකෙන් දෙකක් ලියන්න මට අවස්ථාව ලැබුණා. නන්දා මාලිනීගේ පළවෙනියට තැටිගත කළ ගීතය මම ඒ වැඩසටහනට ලියපු ගීතයක්. 'දුර පාවෙන මේ කුළු ගුවනේ සුදු පාටට කොහොමද හඳුනේ කියලා' ළමා ගීතයක් ඒක. සින්දු ලියන්න පටන්ගත්තේ ඔය විදිහට තමයි. එදාම ලැබෙන මෙලඩි එකට ගීතයක් ලියන්න තමයි තිබුණේ. ඩී.ඩී. ඩැනි වගේ අය හඳන මෙලඩියට තමයි ගීය ලියන්නේ. එතනින් තමයි ගීත ලියන්න පටන්ගන්නේ.

ප්‍රසිද්ධ ගායන ශිල්පීන්ට ගීත ලියන්න අවස්ථාව ලැබුණේ මොන විදිහට ද ?

දවසක් මම ළමා මණ්ඩපය රෙකෝඩින් කරන නම්බර් ටෙන් ස්ටුඩියෝ එකේ එළියට වෙලා සිගරට් එකක් බීබී හිටියා. කරු අයියට නොපෙනෙන්න හොරෙන් තමයි අපි සිගරට් බොන්නේ. එතකොට මම දැක්කා ජෝතිපාල ඈත එනවා. ඒ වෙනකොට ජෝතිපාල කිව්වාම අතිශයින්ම ජනප්‍රිය ගායකයෙක්. දැනුත් එහෙමනේ. ඇවිල්ලා මගෙන් ඇහුවා 'ආ යූ අජන්තා රණසිංහ කියලා.' ජෝතිට හොඳට ඉංග්‍රීසි කතාකරන්න පුළුවන්. මටත් ඒතරම්ම බැරිවුණත් යම් තරමකින් ඉංග්‍රීසි කතා කරන්න පුළුවන්කම තිබුණා. පුළුවන් විදිහට මමත් කතාකළා. ජෝතිපාල කිව්වා එයාට දුවෙක් හම්බවුණා. මම තාත්තා කෙනෙක් වෙලා අජන්තා. මේක දෙවියන්වහන්සේ සහ මගේ නෝනා මට දුන්න තෑග්ගක්. දුව ගැන ලස්සන ගීතයක් ලියල දෙන්න කියලා. මම හීනෙන්වත් බලාපොරොත්තු වෙච්ච දෙයක් නෙවෙයි මේක. ඒ වෙනකොට මම කිසිම වැඩිහිටි ගායකයෙකුට ගීතයක් ලියල තිබුණේ නෑ. ජෝතිපාලත් කලින් කිසිම දවසක මුණගැහිලා කතාකරලා තිබුණේ නෑ. කතා කරන්නේ කොහෙද. අපි කවුද ජෝතිපාල කවුද. අපි නිකං කුඹි වගේ. හැබැයි ජෝතිපාලගේ නංගිලා දෙන්නා ඒ දවස්වල ළමා මණ්ඩපයට එනවා. ජෝතිපාල කිව්වා මම අහලා තියනවා අපේ ගෙදර නංගිලා ඔයා ගැන කතාකරනවා කියලා. ඔයාගේ ගීත හොඳයි කියලා. එයා කිව්වා මුළු ලෝකයේම ලස්සනම තැළවිලි ගීය මට ලියලා දෙන්න කියලා. පුදුම ආශාවකින් ප්‍රීතියකින් තමයි එයා එහෙම කිව්වේ. මට වාසනාවන් මගේ ජීවිතේ වන් පොඩි දූ කුමාරි කියලා මම ගීතයක් ලිව්වා. ඒක මම ලිව්වේ මොහමඩ් සාලි හඳපු තනුවක් අනුව. ඊළඟ සුමානෙම ජෝති ඒක පටිගත කළා. ළමා මණ්ඩපයට මම තනුව අනුව ගීත ලියලා ලබලු තිබුණ පරිවය මට මෙතෙනදි පිහිට වුණා. එතනින් පටන්ගත්ත ගීත ලියන එක ලේක්හවුස් පත්තර රස්සාවට ගියාට පස්සේ වැඩියෙන් සිද්ධ වුණා. අමරදේවට, වික්ටර් රත්නායකට, සනත් නන්දසිරිට, දයාරත්න රණතුංගට ලිව්වා. මේ අයගෙන් සමහරු කලින් දැන හඳුනාගෙන හිටියා. ලියපු ලියපු ගීත ජනප්‍රිය වෙන්න පටන් ගත්තා.

කේමදාස මාස්ටර් තමයි මට ඉස්සෙල්ලම චිත්‍රපටියකට ගීතයක් ලියන්න අවස්ථාව දුන්නේ. එයා තමයි සුනිල් ආරියරත්නට, ප්‍රේමකීර්තිට, කුලරත්න ආරියවංශට මට චිත්‍රපටිවලට ගීත ලියන්න අල්ලලා දුන්නේ. එයා බොහොම පරිත්‍යාගශීලී පුද්ගලයෙක්. කාගේ හරි දක්ෂකමක් දැක්කද අල්ලගත්තා ඒකට තැනක් දුන්නා.

'මංගල මල්දම', 'සිරිමා බෝමැඩ'. 'දුරස්වන්නට මේ ලෙසින්', කිරි කවඩි සිනා, 'පාලු පැලේ මට තනි නෑ ගිමියනි' වගේ ගීත.

මේ විදිහට ගීත ලිව්ලලෙන් ගම් ආදායමකුත් ලැබුණද ?

මුළින්ම ළමා මණ්ඩපයට ගීත විතරක් නෙවෙයිනේ ලිව්වේ. ඉරිදා සරස්වතී මණ්ඩපය ඒ කාලේ චිනාඩි හතලිස් පහක් යන්නේ. සතියේ දවස්වලට තියන ළමා මණ්ඩපයේ කාලය පැය භාගයයි. මේවට යම් යම් මාතෘකා යටතේ ළමයින්ට වැදගත් වන දේවල් ගැන පිටපත් ලියන්න තිබුණා. රටරටවල පුදුම දේවල්. සත්තු වගේ මොනවා හරි අළුත් දෙයක් ගැන පිටපත් ලියන්න ඕනේ. ඒ පිටපත කරු අයියා අනුමත කළාම අපිට රුපියල් තිහක් ලැබෙනවා. ඒ කාලේ ඒක ලොකු මුදලක්. අපි විශේෂයෙන් පොත පත කියෙව්වා. තාගෝර්ගේ ළමයින්ට ගැළපෙන කෙටි කතා එහෙම මම පැය භාගේ නාට්‍යයක් විදිහට ළමා මණ්ඩපයට ලිව්වාම ඒකට රුපියල් හතලිස්පහක් ලැබෙනවා. ඔය අතරතුර අශෝක කොළඹගෙයි මායි ගීත නාටක ලියන්න පටන්ගත්තා. ඒකටත් මුදලක් ලැබෙනවා. ඒ මුදල අපි දෙන්නා බෙදාගන්නවා.

ලේක්හවුස් රස්සාවට යනකම් එහෙම තමයි අතට මුදලක් ලැබුණේ. පස්සේ කැසට්වලට චිත්‍රපටිවලට ගීත ලියන්න පටන්ගත්තට පස්සේ තමයි ගීත වලින් ආදායමක් ලැබෙන්න ගන්නේ. මේ මම ඉන්න ගෙදර සම්පූර්ණයෙන්ම ගීත ලියලා ලැබුණ

සංවාදය සහ සේයා රූ
ශ්‍රීලාල් සෙනෙවිරත්න